කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදී
Issued by Forecasting Division, National Meteorological Centre

**2022 ජුලි මස 04 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2022 ජුලි මස 03 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**සක්‍රීය නිරිතදිග මෝසම් තත්වය හේතුවෙන් බස්නාහිර සහ දකුණු මුහුදු ප්‍රදේශවලත් දිවයිනේ දකුණු අර්ධයේත් සුළං තත්වයේ වැඩිවීම තවදුරටත් බලාපොරොත්තු වේ**

බස්නාහිර, සබරගමුව සහ වයඹ පළාත්වලත් මහනුවර, නුවරඑළිය ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි ඇතිවේ. සබරගමුව පළාතේත් මහනුවර, නුවරඑළිය ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට **මි.මී. 50** ට වැඩි තරමක තද වැසි ඇතිවිය හැක.

ඌව සහ නැගෙනහිර පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් තැනින් තැන සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලත්, බස්නාහිර, දකුණු සහ වයඹ පළාත්වලත් විටින් විට හමන **පැ.කි.මී. (50-60)** ක පමණ තද සුළං ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**WEATHER FORECAST FOR 04 JULY 2022**
**Issued at 1200 noon on 03 July 2022**

**The prevailing windy condition is expected to enhance further in the western and southern sea areas and in the southern half of the island due to the active Southwest Monsoon condition.**

Showers will occur at times Western, Sabaragamuwa and North-Western provinces and in Kandy, Nuwara-Eliya, Galle and Matara districts. Fairly heavy showers **above 50 mm** may occur at some places in Sabaragamuwa province and in Kandy, Nuwara-Eliya, Galle and Matara districts.

Showers or thundershowers may occur at several places in Uva and Eastern provinces and in Hambanthota district during the afternoon or night.

Strong winds about **(50-60) kmph** can be expected at times in the western slopes of the Central hills, Western, Southern and North-Western provinces.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය
## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2022 ජුලි මස 03 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**සක්‍රිය නිරිතදිග මෝසම් තත්වය හේතුවෙන් ඉදිරි දින කිහිපයේදීත් දිවයිනට බස්නාහිර සහ දකුණු මුහුදු ප්‍රදේශවල විටින් විට හමන තද සුළං බලාපොරොත්තු විය හැක.**

**වැසි තත්ත්වය:**

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා දිශාවලින් හමා එයි. සුළඟේ වේගය **පැ.කි.මී. (30-40)** පමණ වේ. කොළඹ සිට ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (60-70)** දක්වා වැඩි විය හැක. පුත්තලම සිට කොළඹ දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (50-60)** දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

කොළඹ සිට ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ ඉතා රළු වන අතර පුත්තලම සිට කොළඹ දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු වේ.

**පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස (මීටර්. 2.5 – 3.5 ක් පමණ) ඉහළ යාමේ හැකියාවක් ද පවතී. මේ හේතුවෙන් පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා ප්‍රදේශවල මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.**

**එබැවින් කොළඹ සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල ඉදිරි පැය 24 ක කාලය තුල ධීවර සහ නාවික කටයුතුවල නොයෙදන ලෙස දැනුම් දෙනු ලැබේ.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS

**Issued at 1200 noon on 03 July 2022**

**Strong winds are expected at times in the western and southern sea areas for next few days due to the active Southwest Monsoon condition.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Puttalam to Hambantota via Colombo and Galle.

**Winds:**

Winds will be westerly to south-westerly and wind speed will be **(30-40) kmph**. Wind speed can increase up to (**60-70) kmph** in the sea areas off the coast extending from Colombo to Pottuvil via Galle and Hambantota. Wind speed can increase up to (**50-60) kmph** in the sea areas off the coast extending from Puttalam to Colombo.

**State of Sea:**

The sea areas off the coast extending from Colombo to Pottuvil via Galle and Hambantota will be very rough. The sea areas off the coast extending from Puttalam to Colombo will be rough. The other sea areas around the island will be moderate.

**There is a possibility to increase swell waves (about 2.5 – 3.5 m) in the sea areas off the coast extending from Puttalam to Pottuvil via Colombo, Galle and Hambantota. There is a possibility that near shore sea areas off the coast extending from Puttalam to Matara via Colombo and Galle, may experience surges due to swell waves.**

**It is advised not to venture in fishing and naval activities in the sea areas off the coast extending from Colombo to Hambantota via Galle within the next 24 hours.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි